# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 21 දරන වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 ජුනි මස 17 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 ජුනි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 15.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2014 අංක 21 දරන වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2014 ජූනි මස 17 වැනි දින]

එල්. ඩී.— ඕ. (අයි. එන්. සී.) 31/2012.

## වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2014 අංක 21 දරන වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම.

2. (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක සහ පුණ්‍යාධාර පදනමේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක සහ පුණ්‍යාධාර පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

(2) සංස්ථාව 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) දිළින්දන්, අසරණ වූවන් සහ රෝගීන්හට ආහාර සහ වෛද්‍යාධාර සැපයීම;

(ආ) ජ්‍යෙෂ්ඨ පුරවැසි ව්‍යාපාර මගින් සපයනු ලබන සේවාවන් පුළුල් කිරීම සඳහා එම ව්‍යාපාරවලට සහාය වීම හා දිරි ගැන්වීම;

(ඇ) සියලුම ආගම්වලට අයත් ආගමික ස්ථාන සංවර්ධනය කිරීම සඳහා සහාය වීම;

(ඈ) ආධාර ලැබීමට සුදුසු දරුවන්ගේ පෙර ළමාවිය සංවර්ධනය කිරීම උදෙසා පෙර පාසල් පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ඉ) අදාළ ආයතනවල එකඟතාව ඇතිව අදාළ ආයතන සමග පහත සඳහන් කාරණාවලදී සහාය වීම—

(i) ළමුන්ගේ සහ කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා සමාජගත කිරීමේ වැඩසටහන්, අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහාය වීම;

(ii) අඩු ආදායම්ලාභී පවුල්වල තරුණයන්ගේ යහපත පිණිස ඉංජිනේරු ශිල්පය, තාක්ෂණය, වඩු කර්මාන්තය, රියදුරු පුහුණුව සහ පරිගණක තාක්ෂණය ඇතුළු විවිධ විෂයයන් පිළිබඳව ස්වයං රැකියා අරමුණු කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම; සහ

(iii) ආධාර ලැබීමට සුදුසු පාසල් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිව අමතර පන්ති සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන, ප්‍රදර්ශන සහ අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම;

(ඊ) සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්තවල නිරතව සිටින සේවකයන්හට සංවිධානය වීමට හා රැකියාවේ දී ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය පිණිස කටයුතු කිරීම සඳහා ඔවුන් දැනුවත් කිරීම;

(උ) ආධාර ලැබීමට සුදුසු සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මගින් ඔවුන් වෙත උපකාර කිරීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීම පිණිස උපකාර දක්වන යම් ආයතනයක යම් සේවකයකුට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(එ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ සහිත සංවිධාන හා ආයතන සමග අවබෝධතාව, සහයෝගිතාව සහ මිත්‍රත්වය වර්ධනය කර ගැනීම; සහ

(ඒ) පාසල් යන වයසේ පසුවන එහෙත් විවිධ හේතු මත පාසල් නොයන ළමුන් හඳුනා ගැනීම සහ ඔවුන් පාසල් වෙත යොමු කිරීමට සහාය වීම සහ සමාජයීය සහ ආර්ථික සහයෝගය ලබාදීම තුළින් ඔවුන්ගේ අධ්‍යාපනයට සහාය වීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ දී වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස් කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොකර ක්‍රියාත්මක කිරීමට සංස්ථාව සහතික විය යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමග සංස්ථාවේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව.

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක ඕනෑම අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් නිශ්චිතව දක්වනු ලබන ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංස්ථාවේ මණ්ඩලයේ ධුර දරන නිලධරයන්, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට සංස්ථාවේ පළමු මණ්ඩලය පත් කරනු ලබන තෙක් හෝ තෝරාගනු ලබන තෙක් සංස්ථාවේ මණ්ඩලය වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාවේ පළමු මණ්ඩලය පත් කිරීම හෝ තෝරා පත් කිරීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් හා උපදේශකවරුන් ද ඇතුළුව මණ්ඩලයේ ධුර දරන සෑම නිලධරයකු ම වර්ෂ තුනක කාලයක් සඳහා පත් කර ගත යුතු හෝ තෝරාපත් කරගත යුතු අතර, එම වර්ෂ තුනක කාල සීමාව ඉකුත් වීමෙන් පසුව එම ධුර දරන නිලධරයා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කර ගැනීම හෝ තෝරාපත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන නිලධරයකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, මණ්ඩලය විසින් සංස්ථාවේ රීති පිළිබඳ සැළකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත් කර ගත යුතු හෝ පත් කර ගත යුතු ය.

(ඈ) (ආ) ඡේදය යටතේ තෝරාපත් කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූර දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ හා ඉටු කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට, අළුත්වැඩියා කිරීමට හා අන්‍යාකාරයකින් ලබා ගැනීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැළකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව ණයට ගැනීම සහ මුදල් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාව වෙත ලබාදෙනු ලබන විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතිය ලබාගත යුතු ය.

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කලහැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ ඕනෑම බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඉඩකඩම් හෝ පෞද්ගලික දේපලකට බලපාන්නා වූ යම් නීතිමය භාරයක් හා කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පාලනය කිරීමට;

(ඊ) සංස්ථාවේ නිළධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරන ලද වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට;

(උ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(ඌ) සංස්ථාව සතු පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය අනෙකුත් ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන් හි දී සේවක පිරිස් පුහුණු කිරීම; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:—

(අ) සාමාජිකත්වය වර්ගීකරණය කිරීම සහා සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ කොන්දේසි සහ නියමයන්;

(ඇ) මණ්ඩලයේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාවේ හා මණ්ඩලයේ නිලධරයන්ගේ සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ එහි අරමුණු ඉටුකර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මෙම වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සැම කල්හි ම මෙම වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ තත්කාලයේ බලපවත්වන රීති වලට යටත් විය යුතු ය.

8. සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජිකයන්ගේ නාම ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය. සාමාජිකයන් ලියාපදිංචි කිරීම.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු ම මුදල් කමිටුව විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ප්‍රමාණයක සංස්ථාවේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් රජයේ විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන් —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත්

යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, සාමාජිකයකුගෙන් යුත් එවැනි ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

11. (1) මණ්ඩලය විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා ම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග වාර්තාව අදාල වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර සමාජ සේවා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

12. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ පදනම වෙත ගෙවිය යුතුව ඇති සියලු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

13. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවට නීතියෙහිලා හැකියාව සහ බලය ඇති අතර, එවැනි සියලු දේපල විකිණීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා ඒ සියලු දේපල සංස්ථාව විසින් දැරිය යුතු ය.

මුදල් හා දේපල අදාල කර ගැනීම.

14. කවර ආකාරයකින් හෝ ලබාගන්නා සංස්ථාවේ මුදල් හා දේපල, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර, එහි කිසිදු කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ හෝ අන්‍යාකාරයකින් ඍජුවම හෝ වක්‍රව සංස්ථාවේ සාමාජිකයන් වෙත ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

15. (1) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිර විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කමිටුවේ යම් ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

16. (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපලක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට ප්‍රථම කැඳවනු ලබන මහ සභා රැස්වීමක දී ඊට පැමිණ සිටින සාමාජිකයන්ගෙන් බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

17. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.